**13 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 9 වන සතිය - ජූනි 29 සිට ජූලි 03 දක්වා**

**13.1 පරිගණනයේ නව නැඹුරුව හා අනාගත දිශානති ගවේෂණය කරයි.**

**ත්‍රිමාණ රූප තාක්ෂණය**

පැරණි චිත්‍රපටවල දක්නට ලැබුණු ද්වීමාන රූප වෙනුවට ඉතා උසස් තාක්ෂණය යොදා ගනිමින් නිපදවන චිත්‍රපටවල ඇති ත්‍රිමාන රූප තාක්ෂණය නිසා චිත්‍රපටවල සජීවී බව වර්ධනය වී ඇත.නවීන තාක්ෂණයට අනුව නිපදවා ඇති උපැස් යුගල් යොදා ගනිමින් නරඹන්නාට චිත්‍රපට රස විඳීමට සලසා ඇත.

**හෝලෝ ග්‍රැෆික් ප්‍රතිබිම්බ සැකසීමේ තාක්ෂණය**

වෙනත් ස්ථානයක රූගත කරන ලද රූපයක ප්‍රතිබිම්බය කැමරා කාචය තුළ තැන්පත් කර ගනිමින් එය වෙනත් දර්ශන තලයක් මත දැක්වීම සඳහා මෙම තාත්ෂණය යොදා ගනු ලබයි.බොහෝ විට අතිබිහිසුණු ජවනිකා රූගත කිරීමේදී මෙම යොදා ගනියි.

**කාටූන් චිත්‍රපට**

කුඩා දරුවන්ගේ මෙන්ම වැඩිහිටියන්ගේද ප්‍රියතම අංගයක් වන කාටූන් චිත්‍රපට ඉතා ජනප්‍රිය වී ඇත්තේ මේවායෙහි රූප ත්‍රිමාන ලෙස නිර්මාණය වන නිසාත් ඒ සඳහා යොදා ගන්නා මෘදුකාංග සහ තාක්ෂණයේ දියුණුව නිසාත්ය.

**අංකිත ශ්‍රව්‍ය සංස්කරණය**

සංගීත නිර්මාණයේදී සහ සංස්කරණයේදී පරිගණකය හා නවීන මෘදුකාංග යොදා ගැනීම වර්තමානයේදී දැක ගත හැකිය.ගීත පටිගත කිරීම මෙන්ම විවිධ ගීත සංයෝග කිරීම මගින් ශ්‍රාවක රසවින්දනය වැඩි කිරීමත් නාද රටා නිර්මාණය කිරීම සඳහාත් නවතම සංස්කරණ මෘදුකාංග භාවිතා කරනු ලැබේ.එමෙන්ම මෙම නිෂ්පාදන සංයුක්ත තැටි,සංඛ්‍යාංක බහු විධ තැටි යොදා ගනිමින් පහසු ආකාරයට ගබඩා කර තබා ගැනීමටද,අවශ්‍ය විටෙක නිවසේ සිට නිවෙස් රංග ශාලා පද්ධති භාවිතයෙන් නැරඹීමට හෝ සවන් දීමටද හැකියාව ඇත.

**අභ්‍යාස**

1.21 වන සියවසේ නව නැඹුරුතා 3ක් සඳහා උදාහරණ දෙන්න.

2.අංකිත ප්‍රජාවක් යනු කවරහුද?එහි වාසි අවාසි සාකච්ඡා කරන්න.

3.පරිගණක සහ මිනිසා අතර ඇති ප්‍රධානතම වෙනස කුමක්ද?

4.මිනිසාට දැනිය හැකි හැඟීම් 4ක් ලියන්න.

5.බුද්ධිය විකාශනය විය හැකි හැකියාවන් මොනවාද?

**සැකසුම**

රසික අත්තනායක මයා

ර/ගෝණකුඹුර ම.වි.